# විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් මානසික අවපීඩනයට පත් වීමට බලපෑ ඇති නව්‍ය සාධක පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්. (ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය ඇසුරෙන්)

*ආර්.ඒ.ඩී.ඩී. රණසිංහ*[1]

2022 වර්ෂයට අනුව ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 25%ක ප්‍රතිශතයක් තරුණ ප්‍රජාව වන අතර, ඉන් 18% පිරිසක් විශ්වවිද්‍යාලයන් තුළ ලියාපදිංචි වී අධ්‍යාපනයේ නියැලී සිටිති. විශ්වවිද්‍යාලය කිහිපයක් නගරබද ව පිහිටා ඇති අතර ඉන් කිහිපයක් ග්‍රාමීය පරිසරයන් තුළ පිහිටා ඇත. වර්තමානයේ විශ්වවිද්‍යාලය තරුණියන්ට සාපෙක්ෂ ව විශ්වවිද්‍යාලය තරුණයන් අධ්‍යාපන සහභාගීත්වය අවම මට්ටමක පැවතීම, විශ්වවිද්‍යාලය අත්හැර යෑම සහ සියදිවි නාසා ගැනීම් වාර්තා විය. විශ්වවිද්‍යාල තරුණයන් සමාජශීලි බව අඩු අතර හුදෙකලා වීමට නැඹුරු ව පෞරුෂය දුර්වල සහිත ව සිය අධ්‍යාපනයෙන් පසු සමාජගත වේ. වර්තමානය වන විට විශ්වවිද්‍යාලයීය තරුණයන් අධ්‍යාපනයෙන් ඈත් වීම, ඉක්මනින් කෝපයට පත් වීමට මානසික අවපීඩනය හේතු සාධක විය හැකි ද යන්න ලබා දෙන අඩු අවධානය හේතුවෙන් සමාජීය සහ පර්යේෂණ හිඩසක් නිර්මාණය වී ඇත. මේ හේතුව මත විශ්වවිද්‍යාල තරුණයා මානසික අවපීඩනයට පත් වීමට බලපෑ ඇති නව්‍ය සාධක මොනවා ද යන්න පර්යේෂණ ගැටලුව ලෙස යොද ගන්නා ලදි. තරුණ මානසික අවපීඩනයට බලපාන නව්‍ය සාධක; මානසික පීඩනය හේතුවෙන් තරුණයන්ගේ වැරදි හැසිරීම; තරුණ මානසික අවපීඩනය අවම කර ගැනීම සඳහා නව්‍ය යෝජනා; මෙම පර්යේෂණයේ අරමුණු වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නාමල් වැව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි රජරට විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන තරුණ විද්‍යාර්ථීන් 100ක් වෙත අහඹු නියැඳීම යටතේ ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරමින් දත්ත ලබා ගන්නා ලදි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය භාවිත කරමින් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක විශ්ලේෂණයක් තුළින් පර්යේෂණයට ආදළ දත්ත විශ්ලේෂණය කරන ලදි. නියැදියෙන් 20%ක් කුමන හෝ මත්ද්‍රව්‍යකට ඇබ්බැහි වී ඇත. නියැදියෙන් 60% පවුල් බරින් හෙම්බත් වෙමින් විශ්වවිද්‍යාලය අධ්‍යාපනය ලබන්නෝ වෙති. විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනයට පරිබාහිර ක්‍රියාකාරකම් වූ කලා මංගල්‍යයන්, පීඨ සංගම්වල ක්‍රියාකාරකම්, නවක කණ්ඩායම් විශ්වවිද්‍යාල සංස්කෘතියට අනුගත කිරීමේ වැඩසටහන් තරුණයන් කේන්ද්‍රව ක්‍රියාත්මක වේ. මේ හේතුවෙන් නියැදියෙන් 3%ක් විශ්වවිද්‍යාලයීය තරුණයන් සිය ජීවිතය පිළිබඳ කලකිරීමට පත් ව ඇත. මෙලෙස විශ්වවිද්‍යාල තරුණයන්ට අධික ලෙස පවුල් බර දැරීමට සිදු වීම, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම, විශ්වවිද්‍යාලයේ විෂයය බාහිර ක්‍රියාකාරකම් හේතුවෙන් අධික මානසික පීඩනයට හසු ව ඇති බව හඳුනාගත හැකි අතර අවසානයේ විශ්වවිද්‍යාලය අධ්‍යාපනය අතහැර දැමීම, සියදිවි නාසා ගැනීම, දිර්ඝ කාලීන රෝගී තත්ත්වයන්ට ගොදුරු වීම නිගමනය විය. විශ්වවිද්‍යාල තරුණයන් සඳහා මනෝ උපදේශන වැඩසටහන් පැවැත්වීම, විශ්වවිද්‍යාලය උපදේශන කමිටුව යාවත්කාලීන කිරීම සහ ඔවුන්ගේ පෞරුෂය සංවර්ධනය කිරීම, අර්ධ කාලීන රැකියාවන් සඳහා යොමු කිරීමට අවශ්‍ය පසුබිම විශ්වවිද්‍යාල පරිසරය තුළ නිර්මාණය කිරීම සහ විශ්වවිද්‍යාලය තුළ විෂයය බාහිර ක්‍රියාකාරකම් අවම කිරීමට පීඨ සංගමය මැදිහත් වීමට කටයුතු කිරීම යෝජනා කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** විශ්වවිද්‍යාල තරුණයා අධ්‍යාපනය, මානසික අවපීඩනය, සියදිවි නාසා ගැනීම, මත් ද්‍රව්‍ය.

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, dushmantharanasinghe31@gmail.com